12 (1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2021-02-23

පැමිණිලි පාර්ශවය : ඩබ්.එස්.එම්.එල් කුමාර මයා,
මල්කාන්ති උක්ඹිවිට,
උඩුගම.

වගඋත්තර පාර්ශවය : නාවික හමුදාපති,
ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
කොළඹ.

පැමිණිලි අංකය : **HRC/4625/12**

පැමිණිල්ල :-

පැමිණිලිකරු ශ්‍රී ලංකා නාවික හමුදාවේ 1996 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා සේවය කර ඇති අතර, 2005 වර්ෂයේ වැඩපත් වාර්තාවක සටහන් නොවීමක් සම්බන්ධව පැමිණිලිකරුට චෝදනා එල්ල වී ඇති බවත්, මෙම චෝදනාවට වරද පිළිගැනීමෙන් පසු රුපියල් 3000/- ක මුදලක් වැටුපෙන් අය කිරීමට නිර්දේශ වී ඇති බවත් සඳහන් කර ඇත.

පැමිණිලිකරු නාවික හමුදා සේවයෙන් පසු වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට සම්බන්ධව සේවය කර ඇති අතර, 2012.09.16 වන දිනට ඉන් ඉවත් වීමට ඉල්ලුම්කර සිටියදී 2005 වසරේ එල්ල වූ චෝදනාව සම්බන්ධයෙන් 2012.09.10 වන දින නැවත පරීක්ෂණයක් සිදුකර වැටුපෙන් රු. 7000/- ක මුදලක් අයකර ගැනීමට නිර්දේශ කර ඇති බවත්, පැමිණිලිකරු රැකියාවෙන් ඉවත් වීමට සිදුවූ ප්‍රමාදය නිසා ලැබීමට නියමිතව තිබූ රැකියා අවස්ථාව අහිමි වූ බවත් පැමිණිල්ලේ සඳහන් කර ඇත.

වැඩිදුර කරුණු සැළකිරීම :-

පැමිණිලිකරු වෙරළ ආරක්ෂකභටයෙකු ලෙස සේවය කරමින් සිටියදී ශ්‍රී ලංකා නාවික හමුදාවට අනුයුක්ත කිරීමට නියෝගයක් ලැබී ඇති අතර, ශ්‍රී ලංකා නාවික හමුදාවට ඉහත දෙවන ඡේදයේ සඳහන් මුදල ගෙවීමට ඇති බව තමා නොදැන සිටි බව ප්‍රකාශ කර ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.co
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පැමිණිලිකරුගේ මූලික වැටුප රු. 16070/- ක් ලෙස සඳහන් වන අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන අංක 06/2006 (iv) ප්‍රකාරව පැමිණිලිකරු රු. 16825/- ක මූලික වැටුපකට සුදුසුකම් ලබා ඇත. තවද පැමිණිලිකරු ඉදිරිපත් කර ඇති පාරිතෝෂික දීමනා ලේඛනයේ මූලික වැටුප ලෙස රු. 16995/- ක මුදලක් සටහන් වී ඇත.

තවද පැමිණිලිකරුගේ පාරිතෝෂික දීමනා ලේඛනයේ පැමිණිලිකරුගෙන් රු. 7747.41/-ක මුදලක් අයවිය යුතු බව සඳහන් කරන අතර, ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් විවිධ අවස්ථාවල කොමිෂන් සභාවට සහ පැමිණිලිකරුට වෙනස් ගණනයක් ඉදිරිපත් කර ඇත.

2017.07.01 දිනැති 06/2006 චක්‍රලේඛනය ප්‍රකාරව පැමිණිලිකරුගේ මූලික වැටුප රු. 16825/-ක් ලෙස සංශෝධනය වුවත් පැමිණිලිකරු රැකියාවෙන් ඉවත් වන දිනය දක්වා ඔහුට ගෙවා ඇති වැටුප රු. 16070/- ක් ලෙස සඳහන් වේ.

වගඋත්තර පාර්ශවීය කරුණු ඉදිරිපත් කිරීම :-

පැමිණිලිකරු 1996.06.25 ශ්‍රී ලංකා නාවික හමුදා සේවයට සම්බන්ධ වී වසර 12 ක මූලික සේවා කාලයක් සම්පූර්ණ කර ස්වකැමැත්තෙන් 2008.06.25 වන දින සේවයෙන් ඉවත් වී ඇති බවත් 2009.09.16 වන දින පැමිණිලිකරුගේ ඉල්ලීමක් මත ශ්‍රී ලංකා නාවික හමුදාපති විසින් ඔහු උපසේවා නාවික නිලධාරියෙක් වශයෙන් සේවයේ නැවත පිහිටුවන ලද බවත් දක්වා ඇත. වගඋත්තර පාර්ශවයේ ස්ථාවරය වී ඇත්තේ, එම ඉල්ලීම සිදුකරන ලද්දේ දීමනා හා උසස්වීම් ලබාගැනීමට සුදුසුකම් වීම සඳහා බවයි.

එසේ වුවත්, එවැනි කිසිදු වැටුප් වැඩිවීමක් හෝ උසස්වීමක් ඔහුට හිමි නොවූ අතර, අවුරුදු 12 කට අධික කාල සීමාවක් සේවය කර ඇති පුද්ගලයෙකු වශයෙන් ඒ පිළිබඳව මනා අවබෝධයක් තිබිය යුතු බවද දක්වා ඇත.

2012.09.16 වන දින තම සේවා කාලය අවසන් වන බව දැන පැමිණිලිකරු විසින් 2012.08.16 වන දින තම සේවය අවසන් කිරීම සඳහා ඉල්ලීමක් කර ඇත. තවද පැමිණිලිකරුගේ දැනුම පරිදි ඒ ආකාරයෙන් සේවය අවසන් කිරීමට බලය ඇත්තේ ශ්‍රී ලංකා නාවික හමුදාපතිවරයාට පමණක් පවසා සිටී. පරිපාලන ප්‍රමාදයක් හේතුවෙන් පැමිණිලිකරු සේවයෙන් නිදහස් කිරීම සිදුව ඇත්තේ 2012.09.24 වන දිනය.

පැමිණිලිකරුට අභ්‍යන්තර විනය පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබුණු අතර, 2012 වර්ෂයේ සැප්තැම්බර් මස වැටුපද තාවකාලිකව පරීක්ෂණය අවසන් වන තුරු නවතා තැබීමට තීරණය වුවද එම වැටුප පැමිණිලිකරුට ගෙවා ඇත. විනය පරීක්ෂණයේ අවසාන තීරණය වී ඇත්තේ ආහාරපාන සඳහා වන රු. 219.91 ක මුදල හැර වෙනත් කිසිදු මුදලක් පැමිණිලිකරුගෙන් අයකරගෙන නොමැති බවයි.

2018.01.23 දරණ ලිපිය මඟින් වගඋත්තර පාර්ශවය ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු 2012.09.29 වන දින සේවයෙන් නිදහස් කර තිබෙන නිසා ප්‍රශ්නගත රාජ්‍ය පරිපාලනන චක්‍රලේඛනයට අනුව හිමිවිය යුතු රු. 16995/- ක වැටුප පැමිණිලිකරුට අදාළ නොවන අතර, සේවයෙන් ඉවත් වන අවස්ථාවේ ලැබී ඇති රු. 16070/- ක වටුප පමණක් අදාළ වන බව සඳහන් කර ඇත.

තවද පාරිතෝෂිකය ගණනය කිරීමේදී මුල්ම වැටුප ලෙස රු. 16995/- ක මුදලක් ගණනය කර ඇති අතර, පාරිතෝෂික මුදලෙන් රු. 219.91ක මුදල සහ රු. 7525.50ක මුදලක් අයකර ඇති බව වගඋත්තරකාර පාර්ශවය දන්වා ඇත.

2019.02.01 දින පැවැති විමර්ශනයේදී වගඋත්තරකාර පාර්ශවය දන්වා ඇත්තේ, 06/2006 චක්‍රලේඛනය මඟින් පැමිණිලිකරුට සමාන නිලයක සිටින නිලධාරිවරයෙකුගේ වැටුප සංශෝධනය වන අවස්ථාවක හිඟ මුදල ඉල්ලා සිටීමට පැමිණිලිකරුට සාධාරණ හේතුවක් පවතින බවයි. තවද පැමිණිලිකරුගෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවට අයවිය යුතු මුදල් සම්බන්ධයෙන්ලේඛනාගාරය පරික්ෂා කර ගණනය කළ යුතු බව පවසා ඇත.

**නිරීක්ෂණ :-**

ඉහත කරුණු ප්‍රකාරව පහත සඳහන් ගැටළු පැනනැගී ඇත.

(අ) පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා නාවික හමුදාවට ගෙවීමට ඇති නිවැරදි මුදල (පැමිණිලිකරුට එරෙහිව ඇති චෝදනා ප්‍රකාරව)

2016.02.02 දිනැති චෙක්පත් අංක 055369 දරණ චෙක්පත මඟින් පැමිණිලිකරුගේ පාරිතෝෂිකයෙන් රු. 7747.41 ලබාගෙන ඇති බව පැමිණිලිකරු සඳහන් කර ඇත. ඒ අනුව පැමිණිලිකරුගෙන් අයකරගත් රු. 7747.41 මුදලට බෙහෙවින් සමාන වන රු. 7745.41 ක මුදලක් 2013.09.20 වන දින වගඋත්තරකරුගේ ලිඛිත දේශනයේ සඳහන් රු. 219.91 ක මුදලේ සහ 2018.01.23 දරණ වගඋත්තරකරුගේ ලිඛිත දේශනයේ සඳහන් රු . 7525.50ක මුදලේ එකතුව බව නිරීක්ෂණය වේ.

(ආ) 2007 සිට 2012 දක්වා පැමිණිලිකරුට ගෙවා ඇති වැටුප් විෂමතා

පැමිණිලිකරුට 2012 වර්ෂය වන විට රු. 16070/- ක වැටුපක් හිමිව තිබී ඇත. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ප්‍රකාරව ඉහත සඳහන් කළ වැටුප රු.16825/- ක් දක්වා සංශෝධනය වී ඇත. තවද ඉහත සඳහන් කළ චක්‍රලේඛනයේ සංශෝධනයක් මගින් පැමිණිලිකරුට අදාළ වන වැටුප රු. 16995/- ක් දක්වා තවදුරටත් සංශෝධනය වී ඇත.

මුදල් අමාත්‍යාංශයේ (එවකට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය) කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තහවුරු කර ඇති පරිදි අංක 06/2006 චක්‍රලේඛනයට අදාළ රු.16995/-ක සංශෝධනය බලාත්මක වන්නේ 2012 වර්ෂයේ ඔක්තොම්බර් මස සිට වන අතර, පැමිණිලිකරු 2012 වර්ෂයේ සැප්තැම්බර් මස සේවයෙන් ඉවත් වී ඇති නිසා ඉහත සංශෝධන ඔහුට අදාළ වන්නේ නැත.

තවද පැමිණිලිකරුගේ පාරිතෝෂිකය ගණනය කිරීම සඳහා මූලික වැටුප ලෙස රු. 16995/-ක මුදල ගණනයට ගෙන ඇති බව නිරීක්ෂණය වී ඇත.

වගඋත්තරකරුවන් විසින් 2014.10.22 දිනැති ලිපියේ දක්වා ඇති පරිදි පැමිණිලිකරු රු. 16825/-ක මුදල මූලික වැටුපට හිමිකම් කියයි. 2019.02.01 දින පැවැති විමර්ශනයේදී වගඋත්තරකරු පිළිගෙන ඇත්තේ පැමිණිලිකරුට සමාන නිලයක් හොබවන නිලධාරියෙකුගේ වැටුප අංක 06/2006 චක්‍රලේඛනය මගින් සංශෝධනය වන්නේ නම් පැමිණිලිකරුගේ වැටුපේ ඇති විෂමතාවය ඉවත් කර රු. 16825/-ක මුදලට හිමිකම් කීමට ප්‍රමාණවත් හේතු සාධක ඇති බවයි.

නිගමනය :-

මේ අනුව වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකරු වෙත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම උල්ලංඝනය වන ආකාරයට කටයුතු කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකරුට 2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ලැබිය යුතු මූලික වැටුපේ හිඟ මුදල ගෙවන ලෙසට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021.03.29 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Ms. Anusuya Shanmuganathan**
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Dr. M.H. Nimal Karunasiri**
Commissioner
Human Rights Commission of Sri Lanka

B/